# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 978/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 10/06/2024 පැය 1625

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. පිස්තෝල අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – කොළඹ අපරාධ කොට්ඨාසය**

2024.06.09 වන දින උදෑසන කාලයේ සීදූව පොලිස් වසමේ උතුරු සීදූව ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර විදේශ රටක නිෂ්පාදිත පිස්තොල අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34ක් වන උතුරු සීදූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. නාඳුනන මල සිරුරක් – කොළඹ අපරාධ කොට්ඨාසය**

2024.06.09 වන දින උදෑසන කාලයේ වාද්දුව පොලිස් වසමේ ඔක්රේ හෝටලය පිටුපස වෙරළතීරයේ නාඳුනන මළ සිරුරක් ගොඩ ගසා ඇති බවට ලද තොරතුරු මත විමර්ශන ආරම්භ කර ඇත.

මෘත ශරීරයේ අනන්‍යතාවය තහවුරු වී නොමැති අතර මෙම පුද්ගලයා නිල් පැහැති දිග ඩෙනිම් කලිසමක් සහ නිල් පැහැති පසු බිමේ සුදු මල් සහිත අත් දිග කමිසයක් හැඳ සිටි ඇති අතර උස අඩි 05 අඟල් 04ක් පමණ සාමාන්‍ය සිරුරකින් හෙබි වයස අවුරුදු 40ත් 45ත් අතර පසුවන පුද්ගලයෙකි.

වාද්දුව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**